Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of

# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

විෂය:- පෙරදිග සංගීතය

සතිය- 3

ශ්‍රේණිය :- 11

Prepared by-කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

## <u>නාඩගම් ගීත සහ නූර්ති ගීත අතර සංගීතයේ වෙනස</u>

නාඩගම් රංග සම්ප්‍රදාය සඳහා දකුණු ඉන්දීය (කර්ණාටක )සංගීතයත්, නූර්ති රංග සම්ප්‍රදාය සඳහා උතුරු ඉන්දියානු (හින්දුස්ථානි) සංගීතයත් බලපා ඇත.

නාඩගම් රංග සම්ප්‍රදායේ <u>උරුට්ටුව</u> නම් අලංකාර කොටසක් ගැයේ.එය ගීතයේ මධ්‍යයේ වැඩි ලයක් ධ්වනිත වන්නාක් මෙන් දැනෙන වචනාර්ථ වලින් සමන්විත වන අතර නූර්ති සම්ප්‍රදායේ **<u>දොහොරාව</u>** නම් තාල රහිත කොටසක් ගායනා වේ.

නාඩගම් රංග ශෛලියේ ප්‍රධාන අවනද්ධ භාණ්ඩ මද්දල දෙකක් වන අතර නූර්ති සම්ප්‍රදායේ ප්‍රධාන අවනද්ධ වාද්‍ය භාණ්ඩය වන්නේ තබ්ලාවයි.

නාඩගම් ගීත වලට නිශ්චිත ගීත ආකෘතියක් නැත. නූර්ති ගීත වල නිශ්චිත ආකෘතියක් ඇත. ඒ ස්ථායි අන්තරා යන ආකෘතියයි.

නාඩගම් රංග සම්ප්‍රදායෙන් මද්දල් පද පසන් ,තීර්ලානා,වඩිමුඩි, තංගපාය, චාපු ආදී තාල පද යෙදෙන අතර නූර්ති සම්ප්‍රදායේ තබ්ලා පද දාදරා ,කෙහෙර්වා, ලාවණී ,ජජ්,ඛෙම්ටෝ,දීප්චන්දී ආදී පද වාදනය වේ.

නාඩගම් සම්ප්‍රදාය සඳහා හොරණෑව සහ මද්දල් දෙකක් වාදනය කරනු ලබන අතර නූර්ති සම්ප්‍රදාය සඳහා සර්පිනාව, තබ්ලාව වයලීනය ආදී සංගීත භාණ්ඩ යොදා ගනු ලබයි.

නාඩගම් සම්ප්‍රදායේ සංගීතඥයා ලෙස **<u>අලගු නායිදු</u>** ප්‍රකට වන අතර,නූර්ති සම්ප්‍රදායේ විශ්වනාත් ලෞජී, අබ්දුල් සතාර්, ජටා ශංකර් වැනි සංගීතඥයින්ගේ නම් ප්‍රචලිතය.

නූර්ති මෙරටට රැගෙන ආවේ **බලිවාලා** ප්‍රමුඛ නාට්‍ය කණ්ඩායම විසින් උතුරු ඉන්දියාවේ සිටයි .




# තබ්ලාව



පැවරුම

1 නාඩගම් හා නූර්ති රංග සම්ප්‍රදායන් මෙරටට රැගෙන ආ නාට්‍යකරුවන් නම් කරන්න.

2 නාඩගම් සම්ප්‍රදායට ආවේණික සංගීතමය තොරතුරු හා නාට්‍යමය තොරතුරු 4 බැගින් ලියන්න.

3 නූර්ති සම්ප්‍රදායට අදාල සංගීතමය හා නාට්‍යමය තොරතුරු හතරක් බැගින් ලියන්න.